# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 637 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 14/04/2024<br>පැය 0545 |

**මාධ්‍ය නිවේදනය**

**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.</u>**

**01. මනුෂ්‍ය ඝාතනයක් - ඌව කුඩාඔය පොලිස් වසම.**

2024.04.13 වන දින දහවල් කාලයේ ඌව කුඩාඔය පොලිස් වසමේ වෙහෙරයාය ප්‍රදේශයේ පහරදීමක් හේතුවෙන් පුද්ගලයෙකු මියගොස් ඇති බවට ඌව කුඩාඔය පොලීසියට ලද තොරතුරක් මත විමශර්න ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 44 ක් වූ ඇතිලිවැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පුද්ගලික ආරවුලක් හේතුවෙන් මරණකරුගේ බිරිඳගේ සහෝදරයා විසින් පහරදී මෙම ඝාතනය සිදුකර ඇති බවට විමශර්නයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය වැල්ලවාය රෝහලේ තැන්පත් කර ඇති අතර සැකකරු ප්‍රදේශයෙන් පලාගොස් ඇත. සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා ඌව කුඩාඔය පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**02. මනුෂ්‍ය ඝාතනයක් - බලන්ගොඩ පොලිස් වසම.**

2024.04.13 වන දින රාත්‍රී කාලයේ බලන්ගොඩ පොලිස් වසමේ පෙට්ටිගලවත්ත ප්‍රදේශයේදී තියුණු ආයුධයකින් පහරදී පුද්ගලයෙකු ඝාතනය කර ඇති බවට බලන්ගොඩ පොලීසියට ලද තොරතුරක් මත විමශර්න ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 32 ක් වූ පෙට්ටිගල වත්ත, මස්සැන්න කොටස ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පුද්ගලික ආරවුලක් දුරදිග යාම හේතුවෙන් තියුණු ආයුධයකින් පහර දී ඝාතනය කර ඇති බවට දැනට සිදු කරන ලද විමශර්නයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය සිද්ධිය වූ ස්ථානයේ පොලිස් ආරක්ෂාව යටතේ ඇත. සැකකරුවන් හඳුනාගෙන ඇති අතර අත්අඩංගුවට ගැනීම සඳහා බලන්ගොඩ පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**03. මනුෂ්‍ය ඝාතනයක් - මාතලේ පොලිස් වසම.**

2024.04.13 වන දින රාත්‍රී කාලයේ මාතලේ පොලිස් වසමේ කොහොඹිලිවෙල ප්‍රදේශයේදී තියුණු ආයුධයකින් පහරදී පුද්ගලයෙකු ඝාතනය කර ඇති බවට මාතලේ පොලීසියට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 27 ක් වූ කොහොඹිලිවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු හා සැකකරු සහෝදරයන් වන අතර දෙදෙනා එකට මත්පැන් බී ඇතිවූ ආරවුලක් දුරදිග යාම හේතුවෙන් තියුණු ආයුධයකින් පහර දී වැඩිමහල් සහෝදරයා විසින් බාල සහෝදරයා ඝාතනය කර ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය මාතලේ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. වයස අවුරුදු 34ක් වන සැකකරු අත්අඩංගුවට ගෙන ඇති අතර මාතලේ පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**04. මනුෂ්‍ය ඝාතනයක් - හුංගම පොලිස් වසම.**

2024.04.13 වන දින සවස් කාලයේ හුංගම පොලිස් වසමේ වාඩිගල ප්‍රදේශයේදී තියුණු ආයුධයකින් පහරදී පුද්ගලයෙකු ඝාතනය කර ඇති බවට හුංගම පොලීසියට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 26 ක් වූ වාඩිගල, රන්න ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පුද්ගලික ආරවුලක් දුරදිග යාම හේතුවෙන් තියුණු ආයුධයකින් පහර දී ඝාතනය කර ඇති බවට දැනට සිදු කරන ලද විමශර්නයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය තංගල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. වයස අවුරුදු 30ක්වූ සැකකරු අත්අඩංගුවට ගෙන ඇති අතර හුංගම පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**05. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් ක්‍රියාත්මක වීමෙන් පුද්ගලයෙකු මියයාම - මදුරාගොඩ පොලිස් වසම**

2024.04.13 වන දින දහවල් කාලයේ මදුරාගොඩ පොලිස් වසමේ ආඳාපොල ප්‍රදේශයේදී මෙරට නිෂ්පාදිත ගිනි අවියක් ක්‍රියාත්මක වීමෙන් බරපතල තුවාල ලැබූ පුද්ගලයෙකු ප්‍රතිකාර සඳහා රිදීගම රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇති බවට මදුරාගොඩ පොලිසියට ලද පැමිණිල්ලක් අනුව විමශර්න ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 51 ක් වූ දොඩම්ගස්ලන්ද ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු කලක සිට මෙරට නිෂ්පාදිත ගිනි අවි උපයෝගී කරගෙන සතුන් දඩයම් කරන පුද්ගලයෙකු බවත් ඔහු විසින් අටවන ලද ගිනි අවියක් මෙලෙස ක්‍රියාත්මක වීමෙන් මෙම අනතුරට මුහුණපා ඇති බවටද සිදු කරන ලද විමශර්නයේදී අනාවරණය වී ඇත. මදුරාගොඩ පොලිස් ස්ථානය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**06. ප්ලාස්ටික් වතුර ටැංකියක් මතට කඩා වැටී දැරියක් මියයාම - අරලගංවිල පොලිස් වසම.**

2024.04.13 වන දින දහවල් කාලයේදී අරලගංවිල පොලිස් වසමේ රුහුණුගම ප්‍රදේශයේ නිවසක වැසිකිලියක් මත රඳවා තිබූ ලීටර් 500 ප්ලාස්ටික් ජල

ටැංකියකින් පහලට සකස් කරන ලද ජල කරාමයකින් දිය නාමින් සිටි දැරියක් මතට ජල ටැංකිය පෙරළීමෙන් අරලගංවිල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇති බවට ලද පණිවිඩයක් මත විමශර්න ආරම්භ කර ඇත.

**මෙලෙස මියගොස් ඇත්තේ වයස අවුරුදු 03යි මාස 07ක් වන රුහුණුගම ප්‍රදේශයේ පදිංචි දැරියකි.**

මෘත ශරීරය පොලොන්නරුව රෝහලේ මෘත ශරිරාගාරයේ තැන්පත් කර ඇත. අරලගංවිල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කර ගෙන යනු ලබයි.

## 07. හදිසි ගින්නක් හේතුවෙන් කාන්තාවක් මියයාම - දිඹුලපතන පොලිස් වසම.

2024.04.13 වන දින රාත්‍රී කාලයේදී දිඹුලපතන පොලිස් වසමේ කොටගල ප්‍රදේශයේ නිවසක කාමරයක් තුල හදිසි ගින්නක් හට ගැනීම හේතුවෙන් කාන්තාවක් පිලිස්සුම් තුවාල ලබා කොටගල රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇති බවට දිඹුලපතන පොලිසියට ලද පණිවිඩයක් මත විමශර්න ආරම්භ කර ඇත.

**මියගිය කාන්තාව වයස අවුරුදු 52 ක්වූ කොටගල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය කොටගල රෝහලේ මෘත ශරිරාගාරයේ තැන්පත් කර ඇත. දිඹුලපතන පොලිසිය වැඩිදුර විමශර්න සිදු කර ගෙන යනු ලබයි.

## 08. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගිරිබාව පොලිස් ස්ථානය.

2024.04.13 වන දින උදෑසන කාලයේ ගිරිබාව පොලිස් වසමේ ඉහල ගිරිබාව ප්‍රදේශයේදී ගිරිබාව පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් අනුව වැටලීමක් සිදුකර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 65 ක් වන** ගිරිබාව **ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගිරිබාව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 09. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් හා නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - හසලක පොලිස් ස්ථානය.

2024.04.13 වන දින දහවල් කාලයේ හසලක පොලිස් වසමේ ඇස්වැද්දුම ප්‍රදේශයේදී හසලක පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් අනුව වැටලීමක් සිදුකර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් හා නීති විරෝධී මත්පැන් ලීටර් 07ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35 ක් වන** බටුමුල්ල **ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

හසලක පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 10. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කනගරායන්කුලම් පොලිස් ස්ථානය.

2024.04.13 වන දින අළුයම් කාලයේ කනගරායන්කුලම් පොලිස් වසමේ කුංජිකුලම් ප්‍රදේශයේදී කනගරායන්කුලම් පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද

තොරතුරක් අනුව වැටලීමක් සිදුකර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25ක් වන මාන්කුලම් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කනගරායන්කුලම් පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 11. සැකකටයුතු මරණයක් - අරලගංවිල පොලිස් වසම.

2024.04.13 වන දින අරලගංවිල පොලිස් වසමේ ඉසුරුගම ප්‍රදේශයේ නිවසක පුද්ගලයෙකු සැකකටයුතු ලෙස මිය ගොස් ඇති බවට අරලගංවිල පොලිසියට ලද තොරතුරක් මත විමශර්න ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 43 ක් වූ ඉසුරුගම, මැදගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු 2024.04.12 වන දින රාත්‍රී කාලයේ බීමතින් තම සහෝදරයාගේ නිවසට පැමිණ රාත්‍රී ආහාර ගෙන නින්දට ගොස් ඇති බවත් 2024.04.13 වන දින උදෑසන මෙලෙස මියගොස් සිටින බව දැකීමෙන් පසු සහෝදරයා විසින් පොලිසියට පැමිණිලි කර ඇති බවට සිදු කරන ලද විමශර්නයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය පොළොන්නරුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අරලගංවිල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 12. බලපත්‍ර නොමැතිව මැණික් ගරමින් සිටි සැකකරුවන් පස් දෙනෙකු අත්අඩංගුවට - මස්කෙළිය පොලිස් ස්ථානය.

2024.04.13 වන දින සවස් කාලයේදී මස්කෙළිය පොලිස් වසමේ බ්‍රවුන්ස්වික් වත්ත ප්‍රදේශයේදී මස්කෙළිය පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරකට අනුව වැටලීමක් සිදුකර බලපත්‍ර නොමැතිව මැණික් ගරමින් සිටි සැකකරුවන් පස් දෙනෙකු මැණික් ගැරීම සඳහා උපයෝගී කරගත් උපකරණද සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 52,53,57 හා 58 යන වයස්වල පසුවන මස්කෙළිය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මස්කෙළිය පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 13. මාරක රිය අනතුරක් - වැලිපැන්නගහමුල්ල පොලිස් වසම.

2024.04.13 වන දින උදෑසන කාලයේ වැලිපැන්නගහමුල්ල පොලිස් වසමේ නාත්තන්ඩිය උඩුබද්දාව මාගර්යේ කළුවතුර ප්‍රදේශයේදී නාත්තන්ඩිය දෙස සිට උඩුබද්දාව දෙසට ධාවනය වූ කාර් රථයක් මාගර්ය අයිනේ සිටි කාන්තාවකගේ ගැටී මාගර්යෙන් ඉවතට පැන දුරකතන රැහැන් කනුවක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ මඟී කාන්තාව දුනුකදෙනිය රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා කුලියාපිටිය රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 46 ක් වූ අඹන්පොල, ඇහැටුවැව ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

අනතුරින් බරපතල තුවාල ලැබූ කාර් රථයේ රියදුරු, රියදුරුගේ බිරිඳ, වයස අවුරුදු 05 ක් වන පිරිමි දරුවෙකු හා අවුරුදු 03 ක් වන ගැහැණු දරුවෙකු ප්‍රතිකාර සඳහා කුලියාපිටිය රෝහලට ඇතුලත් කර ඇත.

මෘත ශරීරය කුලියාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර වැලිපැන්නගහමුල්ල පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කායර්ාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**